කලාප අධ්‍යාපන කාර්යාලය - මීනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

**සුවෙන් පෙරට**
**e ඉගෙනුම් පියස**
**මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

| වාරය - 2 | | |
|---|---|---|
| ශ්‍රේණිය : 10 | විෂයය : සිංහල සාහිත්‍ය රසාස්වාදය | පාඩම : ( 8 ) උතුරෙන් |

❖ කකතුවරයා

< සාගර පලන්සූරිය මහතා ( කලල්ඇල්ලේ ආනන්ද සාගර)

< ප්‍රවීණ ලේඛකයෙකි

< පුවත්පත් කලාවේදියෙකි.

< කවියෙකි.

< දේශකයෙකි, ගුරුවරයෙකි.

< පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි.

➢ සාගර පලන් පලන්සූරිය මහතා හැදින්වූ අන්වර්ථ නාමය කුමක්ද ?

---------------------------------------------------------------------------------------------

➢ මොහුගේ ප්‍රකට ම කාව්‍ය කෘතිය නම් කර එයට පාදක කොට ගත් ග්‍රන්ථය හා කතුවරයා නම් කරන්න

---------------------------------------------------------------------------------------------

➢ එතුමා විසින් රචිත වෙනත් කෘති මොනවා ද?

---------------------------------------------------------------------------------------------

➢ මොහුගේ කාව්‍ය නිර්මාණයන් සඳහා වස්තු විෂයයන් වූයේ මොනවාද ?

---------------------------------------------------------------------------------------------

❖ උතුරෙන් කවිය පිළිබඳ හැඳින්වීමක් :-

දකුණේ සිංහල හා උතුරේ ද්‍රවිඩ ජනතාව අතර පවත්නා වෙනස නොඑසේනම් අසමගිය යන ජාතික ප්‍රශ්නය මේ උදෙසා තේමා කොට ගෙන ඇත. මෙම ගැටළුව කෙරෙහි මානවීය බැල්මෙන් යුතුව ජනතාව දුරවබෝධයෙන් නිරවබෝධ කිරීමට රචිත පද්‍ය පන්තියක් සේ උතුරෙන් පද්‍ය පන්තිය හැඳින්විය හැකිය. කෙටියෙන් කියතොත් ජනවාර්ගික අර්බුදය මේ උදෙසා ප්‍රස්තුත කොට ගනී.

02. පද්‍ය පන්තිය කියවා පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න

1, සාගර පලන්සූරිය මහතා කුමන කවි පරපුර නියෝජනය කළ කවියෙක්ද?

------------------------------------------------------------------------------------------

2. එම කවි පරපුර ට අයත් කවීන් දෙදෙනෙකු නම් කරන්න.

------------------------------------------------------------------------------------------

3. සුදෝ සුදු කවි පන්තියේ විශේෂත්වය කුමක්ද ?

------------------------------------------------------------------------------------------

4. මෙම කවි පන්තිය සඳහා පාදක කොටගෙන ඇත්තේ කුමන සාමාජීය වකවානුවක් ද?

------------------------------------------------------------------------------------------

5. කවියා කම්පනයට පත්ව ඇත්තේ කුමන හේතුවක් නිසාද?

------------------------------------------------------------------------------------------

6. කවියා යොදාගෙන ඇති කාව්‍යෝක්ති දෙකක් නම් කරන්න.

------------------------------------------------------------------------------------------

7 . මෙම පද්‍ය නිර්මාණය සම්බන්ධව ඔබට දැනෙන හැඟීම් කරුණු 5ක් යටතේ ගොනු කොට දක්වන්න.

------------------------------------------------------------------------------------------

03. අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න

❖ . මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්

බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්

---------------------------------------------------------

---------------------------------------------------------

( අ ) .ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න .

( ආ) ." බැද අති පවුරු පදනම් " යනුවෙන් කවියා හඳුනාගන්නේ මොනවාදැයි

පැහැදිලි කරන්න.

---------------------------------------------------------

❖ ගෙන එයි මිහිරි ගී මදනල හමන විට

වැටහෙයි නොවැටහුණු සැහවුණු කරුණු මට

නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට

උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

( අ ) ඉහත කවියේ කැපී පෙනෙන කාව්‍යෝක්ති ලියා දක්වන්න.

------------------------------------------------------------------------------------------

( ආ ). උතුරේත් දකුණේත් කවියා දකින සමානතා මොනවාද ?

------------------------------------------------------------------------------------------

04. ( අ )  කොටසට  අදාළ කවි පද  ( ආ ) කොටස තුළින් තෝර ලියන්න

( අ ) කොටස

01. ස්වභාදහම එකම අයුරින් සලකීම, රූපක, ධ්වනි පූර්ණ ගුණය ගැබ් කොට තිබීම.

02. සෞන්දර්යාත්මක හැඟීම් සහ මනා ලෙස  අනුප්‍රාසය යොදා තිබීම.

03 . ධ්වනි ගුණයෙන් අනූන බව,  සෑම වෘත්තිකයෙකු වෙසෙන බව සඳහන්  වීම,
හෘදයාංගම වදනින් පෝෂණය කර තිබීම.

04 . කටවහර යොදා ගෙන ජන හදට සමීප කළ අවස්ථාව.

05. ජාතික  සමගියට බාධා පමුණුවන්නන් උතුරේ මෙන්ම දකුණේ ද සිටින බව.

06 .කාෂ්ඨ පරිසරයක වුවත් මනා ලෙස උපමාවන් මගින්  සෞන්දර්යාත්මක කවි සිතුවිලි ඇති කරලීම.

07. උතුරේ සමාජය තුළ මානවීය ගුණාංග මෙන්ම සංවේදී හදවත් ඇත්තෝ වෙසෙන බව.

( ආ ) කොටස

01 .  වැටහෙයි නො වැටහුණු  සැඟවුණු කරුණු  මට
උදයට පෙනේ බෝල් පිණිබිඳු පබලු  ඇට

02 .  රන්තරු රිදීතරු හවසට පෙළට  ඇදේ
පොල් ගස් මුදුනේ මෙන් තල්ගස් මුදුනේ  වැදේ

03.  සුරුවටුව ට එක් වී  උතුරේ  ඔතන
බේදය පිළිස්සී හමුවේවා  දකුණ

04 .  දහඩිය හෙලන අය හිරිහැර අතර  වැටි
කළුගල් යකඩ නොව උණු වී හැළෙන  ඉටි

05  බැඳ ඇති විලංගුව පා මිණි  සලඹ  කොට
සලකා වැටෙන  එය බැන්ද හු ඉදිරි  පිට

06 .  නිල් පැහැයක් නැතත් මේ වැලි පොළවට  පිට
උදයට පෙනේ බෝල් පිණිබිඳු පබලු  ඇට

07 .  තනි බව දැනේ එහි කවුතුක රසය  ඇත
මා පිට  ගෙයක බව සලකනු පුරුදු  නැත

05. පහත සඳහන් ප්‍රශ්න  වලට වචන 150කට නොඅඩු විචාරයක් ලියන්න.

01 . උතුරෙන් කවි නිර්මාණය සඳහා පාදක වී ඇති වස්තුවිෂය   උදාහරණ සහිතව විමසන්න.

02 . මෙම පද්‍ය පන්තියේ කාලීන වැදගත්කම පහදන්න.

03 . සිය  නිර්මාණයේ සාර්ථකත්වය උදෙසා කවියා යොදාගත් භාෂාව පිළිබඳ විමසීමක් කරන්න

බප/මිනු/ දෙවලපල ආනන්ද ම.වි.

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය,

ඩබ්.කේ.ඒ.යූ වරුසප්පෙරුම.